*සියලු ම හිමිකම් ඇවිරිණි]*
***All Right Reserved]***

# අධ්‍යාපන කලාපය - මතුගම
# Educational Zone - Mathugama

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**13 ශ්‍රේණිය**

**ඉතිහාසය II**

*කාලය පැය තුනයි*

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1978 දක්වා**

උපදෙස් :-

* පළමුවැනි ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.
(පළමුවැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් සපයා ඇත.)

---

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.
(i) කල්‍යාණි නදී
(ii) උරුවේල
(iii) නාගදීපය
(iv) හුරුළු වැව
(v) මධ්‍යම පළාත
(vi) යාපහුව
(vii) මල්වාන
(viii) හම්බන්තොට
(ix) ඉබ්බන්කටුව
(x) බුන්දල
(xi) කුරුවිට බටදොඹලෙන
(xii) රංචමඩම
(ලකුණු 12)

02. ලක්දිව ආර්ය ජනාවාස පිහිටුවීමට ප්‍රථමව ශ්‍රී ලංකාවේ ජනාවාස දක්නට ලැබුණි. මේ අනුව ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික ජනාවාස පැහැදිලි කරන්න.
**(ලකුණු 16)**

03. රජරට ශිෂ්ටාචාරය හැඩගැසීමෙහි ලා පහත සඳහන් භූගෝලීය සාධක බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
(i) ස්වාභාවික වරායන් (ii) මධ්‍ය කඳුකරය (iii) ගංගා පද්ධතිය
**(ලකුණු 16)**

04. අනුරාධපුරය, අගනුවර කොටගෙන රාජධානියක් පිහිටුවීමෙහි ලා පණ්ඩුකාභයගේ කාර්යභාරය පරීක්ෂා කරන්න.
**(ලකුණු 16)**

05. පොළොන්නරු රාජධානියේ පරිහානිය හා බි!ද වැටීමට බලපෑ සාධක විචාරාත්මකව පරීක්ෂා කරන්න.
**(ලකුණු 16)**

06. දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රමබාහු රජු යටතේ ඇති වූ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධීන් සැකෙවින් සාකච්ඡා කරන්න.
**(ලකුණු 16)**

07. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ඇති වූ වතු වගාව උඩරට සමාජයේ ඇති කළ ආර්ථික, සමාජ හා සංස්කෘතික බලපෑම පරීක්ෂා කරන්න.
**(ලකුණු 16)**

08. ක්‍රි.ව. 1818 බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව පළමු නිදහස් සටන ඇති වීමට බලපෑ හේතු විමසන්න.

**(ලකුණු 16)**

09. **පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

(i) අනුරාධපුරයේ පරිහානිය හා බිඳ වැටීම
(ii) ක්‍රි.ව. 5 වන සියවස තෙක් බුද්ධාගමේ වර්ධනය
(iii) අනුරාධපුර යුගයේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය
(iv) ක්‍රි.ව. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
(v) කෝට්ටේ යුගයේ සාහිත්‍යය
(vi) ලන්දේසීන්ගේ දේශපාලන හා සංස්කෘතික වෙනස්කම්

**(එක් කෙටි සටහනකට ලකුණු 8 බැගින්)**